# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/34 - 2013 අප්‍රේල් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2013.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 (vi)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 3 සහ 191 වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 මෝටර් වාහන (ඉහළ එන්ජින් ධාරිතාවයක් සහිත මෝටර් බයිසිකල් ලියාපදිංචි කිරීම) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. 2012 මැයි මස 18 වන දින අංක 1758/82 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මෝටර් වාහන (වාහන තැනීම) නියෝගවල විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද, පහත සඳහන් අවශ්‍යතා සපුරාලනු ලැබූ, එන්ජිමේ ඝන ධාරිතාවය ඝන සෙන්ටිමීටර් (සීසී) 450 හෝ ඊට අඩු සහ ඝන සෙන්ටිමීටර් (සීසී) 1001 ට නොවැඩි මෝටර් බයිසිකල්, -

(අ) දේශීය වශයෙන් එකලස් කරනු ලැබුවා වූ හෝ ආනයනය කරනු ලැබුවා වූ වුව ද, නව උපාංග භාවිතා කර ඇත්නම් ;

(ආ) ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා ඉසව් පුහුණු කිරීමට පමණක් භාවිතා කර ඇත්නම් ;

(ඇ) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමතය ලබාගෙන ඇත්නම් ;

(ඈ) මෙම වර්ෂය සඳහා නියමිත ගාස්තු, අධිභාර හෝ වෙනත් අයකිරීම් ගෙවා ඇත්නම්.

මෙම පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කළ හැකි ය.

මෙම නියෝගවල කාර්ය සඳහා "පනත" යන්නෙන් (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත සහ ඒ යටතේ සාදන ලද නියෝග අදහස්වේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙම නියෝගවල විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ, 2 වන නියෝගයේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි දේශීය වශයෙන් එකලස් කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මෝටර් බයිසිකල් සම්බන්ධයෙන් මෙම නියෝගයේ විධිවිධාන අදාළ විය යුතු ය.

04 - 832/1

---

එල්.ඩී.බී. 24/51 (vi)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඈ සහ 213ඉ වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 මෝටර් ප්‍රවාහන (අධිභාර) නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

2. දේශීය වශයෙන් එකලස් කරනු ලැබූ සහ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මෝටර් සයිකල් සඳහා -

(අ) එන්ජිමේ ඝන ධාරිතාවය ඝන සෙන්ටිමීටර් (සීසී) 450 හෝ ඊට වැඩි සහ එන්ජිමේ ඝන ධාරිතාවය ඝන සෙන්ටිමීටර් (සීසී) 1001 හෝ ඊට අඩු වූ ද ;

(ආ) එක් මෝටර් සයිකලයක් සඳහා රු, 25,000.00ක මුදලක් වූ ද.

අධිභාරයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලැබිය යුතු ය.

3. මෙම නියෝගවල විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ, 2 වන නියෝගයේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි දේශීය වශයෙන් එකලස් කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මෝටර් බයිසිකල් සම්බන්ධයෙන් මෙම නියෝගයේ විධිවිධාන අදාළ විය යුතු ය.

04 - 832/2

---

එල්.ඩී.බී. 24/51 (vi)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වන දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සහ, 2012 මැයි මස 18 වන දින අංක 1758/32 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගවලින් අවසන් වරට සංශෝධිත, 1983 ජුනි මස 03 වන දින අංක 248 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1983 මෝටර් වාහන (වාහන තැනීම)

නියෝගවල 3 වැනි නියෝගයේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ -

"(ආ) මෝටර් බයිසිකලයක එන්ජිමේ ඝන ධාරිතාවය ඝන සෙන්ටිමීටර් (සීසී) 450 නොඉක්මවිය යුතු ය :

කෙසේ වුව ද, ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන මෝටර් සයිකලයක එන්ජිමේ ඝන ධාරිතාවය ඝන සෙන්ටිමීටර් (සීසී) 450 ඉක්මවිය හැකි නමුත් එය ඝන සෙන්ටිමීටර් (සීසී) 1001 නොඉක්මවිය යුතු ය."

කෙසේ වුව ද තවදුරටත්, ඉහත අතුරු විධානයේ නිශ්චිතව දක්වන ලද එන්ජිමේ ඝන ධාරිතාවය, මෙම නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ දී දේශීය වශයෙන් එකලස් කරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මෝටර් බයිසිකල් සඳහා පමණක් අදාළ විය යුතු ය.

04 - 832/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.